# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

**කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය**
**மகளீர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு**
**Ministry of Women, Child Affairs and Social Empowerment**


| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| DSD/HO/06/EP/03/විදේශ රැකියා/2022 | ........................................ | 2022.11.18 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වරුන් ,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වරුන් ,
සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ වරුන්,

**<u>සමෘද්ධිලාභී හා අඩු ආදායම්ලාභී පවුල් වල තරුණ තරුණියන් සඳහා ජපන් භාෂා ප්‍රවීණතාවය හා වෘත්තීය කුසලතා ලබා දීමට පහසුකම් සැලසීමේ වැඩසටහන</u>**

උක්ත වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් අපගේ විෂය භාර රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී 20200.11.16 දින විශේෂ රැස්වීමක් පවත්වන ලදි. එම රැස්වීමේදී ගනු ලබන තීරණ අනුව එළඹෙන දෙසැම්බර් මස මුලදී ජපන් භාෂා ප්‍රවීණතාවය ලබා දීමේ ප්‍රථම අදියරේ පුහුණු වැඩසටහන් මේ සමඟ දක්වා ඇති ඇමුණුම් අංක 01හි සඳහන් සථාන වලදී පමණක් ආරම්භ කිරීමට තීරණය කරන ලදි.මෙම එක් මධ්‍යස්ථානයක පුහුණු පංති දෙකක් පැවැත්වීමට අදහස් කරන අතර එක් පුහුණු පංතියකට 50 දෙනෙකු බඳවා ගැනීමට තීරණය කරන ලදි.

02. එමෙන්ම එම පුහුණු වැඩසටහන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අධීක්ෂණයෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිසි සම්බන්ධීකරණයෙන් ජාතික සමාජ සංවර්ධන ආයතනය මඟින් මෙහෙයවීමට තීරණය කරන ලදි.

03. ඒ අනුව එළඹෙන දෙසැම්බර් මස පළමු සතිය තුළදී අප දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ මැදිහත් වීමෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ නිලධාරීන්ගේ සහභාගීත්වය ඇතිව පහත සඳහන් නිර්ණායක කෙරෙහි අවධානය යොමු කර පුහුණුලාභීන් සඳහා දෙවන සම්මුඛ පරීක්ෂණ පැවැත්විය යුතු වේ. මෙම සම්මුඛ පරීක්ෂණ ඇමුණුම් අංක 01 හි සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී 2022 දෙසැම්බර් 01 දින සිට 06 දින දක්වා අතර කාලය තුළදී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ නිලධාරීන්ගේද සහභාගිත්වයෙන් පැවැත්වීමට කටයුතු කළ යුතු අතර එම ආයතන වෙත දැන්වීම සඳහා ඔබ විසින් පැවැත්වීමට සැලසුම් කළ සම්මුඛ පරීක්ෂණ පිළිබඳ තොරතුරු අදාළ ආයතන වෙත කඩිනමින් දැන්වීම පිණිස ඇමුණුම් අංක 02ට අනුව සම්පූර්ණ කර 2022.11.23 දිනට පෙර samurdhimarketing@gmail.com වෙත හා marketing managers whatsupp Group එක වෙත දැන්විය යුතුය. එමෙන්ම පුහුණුලාභීන් බඳවා ගැනීමේදී කාන්තාවන් 65% වන සේ බඳවා ගැනීමට කටයුතු සැලසුම් කළ යුතුවේ.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaram**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 28** |

04. එමෙන්ම පුහුණු පාඨමාලාව පැය 480කින් සමන්විත පූර්ණ කාලීන පාඨමාලාවක් ලෙස ජාතික සමාජ සංවර්ධන ආයතනය විසින් මෙහෙයවීමට තීරණය කර ඇති අතර ඉන් පැය 300ක කාලයක් ජපන් භාෂා ප්‍රවීනතා ලබා දීමටත් පැය 180ක කාලයක් වැඩිහිටියන් රැකබලා ගැනීම ඇතුළු වෘත්තීය පුහුණු පාඨමාලාවක් පැවැත්වීමටත් කටයුතු සැලසුම් කර ඇත. මෙහිදී දිස්ත්‍රික් පුහුණු උපදේශකවරුන් විසින් දිනකට පැය 06 බැගින් සතියේ දින 05 තුළ වැඩසටහන් පවත්වන ඇති අතර සති අන්තයේ එක් දිනක් මාර්ග ගත ක්‍රමයට පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇත.

05. පුහුණු ලාභීන් බඳවා ගැනීමේ මූලික සුදුසුකම්.

i. වයස අවුරුදු 17-25 අතර සමෘද්ධිලාභී හෝ අඩු ආදායම්ලාභී පවුලක සාමාජිකයකු වීම.
ii. ප්‍රජා මූල සංවිධාන සාමාජිකයකු වීම.
iii. අයදුම්කරු විදේශවීම සම්බන්ධයෙන් දෙමවුපියන්ගේ කැමැත්ත.
iv. ශාරීරික හා මානසික යෝග්‍යතාව.
v. ශරීරයේ Tattoos නොමැති වීම.
vi. අ.පො.ස. (සා/පෙළ) සමත් හා අ.පො.ස. (උ/පෙළ) දක්වා සමත්.
vii. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් පවත්වනු ලබන ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතුය.
viii. පිරිමි අයදුම්කරුවන් සඳහා අවම උස සෙ.මී. 155ක් හා අවම බර කි.ග්‍රෑ. 50ක් විය යුතු අතර කාන්තාවන් සඳහා අවම උස සෙ.මී. 152ක් හා අවම බර කි.ග්‍රෑ.45ක් විය යුතුය.
ix. මීට අමතරව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ජාතික සමාජ සංවර්ධන ආයතන විසින් ලබා දෙන විශේෂ උපදෙස් කෙරෙහි ද සැලකිල්ල යොමු කළ යුතුවේ.
x. එමෙන්ම මීට පෙර විදේශ ගත වීම සඳහා ශිෂ්‍ය වීසා හෝ වෙනත් වීසා ක්‍රමයක් යටතේ අයදුම් කර ඉන් ප්‍රතික්ෂේප වූ අයවලුන් බඳවා ගැනීමට කටයුතු නොකල යුතු වේ.
xi. පාඨමාලා සඳහා එක් කණ්ඩායමකට උපරිමය 50කට සීමා කළ යුතුය.

06. පාඨමාලාව සඳහා ඩිප්ලෝමා සහතිකයක් ජාතික සමාජ ආයතනයෙන් ලබා දීමට සැලසුම් කරන බැවින් එම ආයතනයේ ලියාපදිංචි වීම සඳහා අයදුම් පතක් ඇමුණුම් අංක 03 ලෙස මේ සමඟ ලබා දෙන අතර අදාළ ආකෘති පත්‍ර නිවැරදිව පුරවා 2022.11.30 දිනට පෙර භාර ගෙන සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතියේ ව්‍යාපෘති කළමනාකරු භාරයේ තබා ගත යුතුවේ.

07. එමෙන්ම මෙම පුහුණු පාඨමාලාවන් පූර්ණ කාලීන වැඩසටහනක් ලෙස පැවැත්වීමට අදහස් කර ඇති හෙයින් ඒ සඳහා සුදුසු ස්ථානයක් නම් කර 2022.11.21 දිනට ප්‍රථම samurdhimarketing@gmail.com වෙත යොමු කළ යුතුවේ.

එම්.ජී.එස්.එස්. කිත්සිරි
අධ්‍යක්ෂ (අලෙවි)

අ/කළේ:- ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1. ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. සාමාන්‍යාධිකාරි, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය - කා.දැ.ගැ.ස.
3. අධ්‍යක්ෂ, ජාතික සමාජ සංවර්ධන ආයතනයේ - කා.දැ.ගැ.ස.